සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 34 S

## විද්‍යාව

කාලය පැය දෙකයි

උපදෙස් :
- I කොටස - ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සළකුණු කරන්න.
- සියලුම ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර තෝරන්න.

01. පහත පිළිතුර අතරින් අජීවී ද්‍රව්‍ය පමණක් ඇති පිළිතුර තෝරන්න.
1. ළමයා, පොල් ගස, ගඩොල
2. ගඩොල, පෑන, මකනය
3. ජලය, බයිසිකලය, ගිරවා
4. පොල්ගස, අඹ ගස, මෑ වැල

02. රෙදි සේදීමේදී ඉතා හොඳින් කුණු ඉවත් කරගත හැක්කේ පහත කුමන ජලය භාවිතයෙන් ද?
1. ළිං ජලය 2. ගංගා ජලය 3. මුහුදු ජලය 4. වර්ෂා ජලය

03. ක්ෂුද්‍ර ජීවීන් හොඳින් නිරීක්ෂණය කළහැකි අවස්ථාව තෝරන්න.
1. එළිමහන් ස්ථානයක ජලය පියවි ඇසින් නිරීක්ෂණය කිරීම.
2. අත් කාචයක් තුළින් පල්වූ ජලය නිරීක්ෂණය කිරීම.
3. කොම්පෝස්ට් පොහොර දියකර ලබාගත් ජලය කාචයකින් නිරීක්ෂණය කිරීම.
4. පල්වූ ජලය අන්වීක්ෂයකින් නිරීක්ෂණය කිරීම.

04. අත් කාචයකින් එකවරකදී වැඩිම ජීවීන් සංඛ්‍යාවක් නිරීක්ෂණය කිරීමට හැකිවන්නේ,
1. පළගැටියන් 2. හැකරැල්ලන් 3. වේයන් 4. ගොළුබෙල්ලන්


05. පිළිවෙලින් ශාක, සතුන් හා ක්ෂුද්‍ර ජීවීන් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. කෙසෙල්, කුරුමිණියා, වේයා
2. නෙළුම්, ඉස්ගෙඩියා, බැක්ටීරියා
3. වේයා, බැක්ටීරියා, කෙසෙල්
4. කෙසෙල්, ඉස්ගෙඩියා, වේයා

06. සංචරණයක් හෝ චලනයක් දක්නට නොලැබෙන්නේ,
1. මුහුදු මල 2. නිදිකුම්බා 3. ගැඩවිලා 4. බයිසිකලය

07. යම් ජීවියෙකු ස්වයංපෝෂී ලෙස හැඳින්වීමට එම ජීවියා සතුවිය යුතු ප්‍රධානතම ලක්ෂණය වන්නේ,
1. ඔවුන් ස්වසනය කිරීමයි.
2. වර්ධනය වීමයි.
3. ප්‍රභාසංස්ලේෂණය කිරීමයි.
4. සංචරණය කිරීමයි.

08. සතුන් , ශාක භක්ෂක සහ මාංශ භක්ෂක ලෙස වර්ග කිරීමේදී පදනම් කරගන්නේ,
1. භෝජන ක්‍රමයයි. 2. භෝජන විලාසයයි. 3. සංචරණ ක්‍රමයයි. 4. ජීවත් වන පරිසරයයි.

09. පහත රූපයේ දැක්වෙන ජීවීන් සතු ලක්ෂණය වන්නේ,



1. වර්ධනයයි. 2. ප්‍රජනනයයි. 3. පෝෂණයයි. 4. ස්වසනයයි.

10. භූගත ජලය පවතින ආකාරයකි,
1. සාගර ජලය 2. ගංගා ජලය 3. උල්පත් ජලය 4. පොකුණු ජලය


11. අවශ්‍ය පමණට ජලය පානය නොකරන අයකු මුහුණ පාන ගැටළුවක් වන්නේ,
1. මලබද්ධය ඇතිවීමයි 2. අධික රුධිර පීඩනය ඇතිවීමයි 3. දියවැඩියාව සෑදීමයි 4. සෙම්ප්‍රතිශ්‍යාව වැළඳීමයි



Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!

12. ශිෂ්‍යයෙකු කරන ලද ක්‍රියාකාරකමක රූප සටහනක් පහත දැක්වේ.





මෙහිදී ලැබෙන නිරීක්ෂණය සහ නිගමනය දැක්වෙන පිළිතුර තෝරන්න.

| නිරීක්ෂණය | නිගමනය |
|---|---|
| 1. අවර්ණ හුණු දියරයේ වර්ණය වෙනස් නොවේ. | ස්වසනයේ දී ඔක්සිජන් පිටවේ. |
| 2. අවර්ණ හුණු දියරය කිරි පැහැයට හැරේ. | ස්වසනයේ දී ඔක්සිජන් පිටවේ. |
| 3. අවර්ණ හුණු දියර කිරි පැහැයට හැරේ. | ස්වසනයේ දී කාබන් ඩයොක්සයිඩ් වායුව පිටවේ. |
| 4. අවර්ණ හුණු දියරයේ වර්ණය වෙනස් නොවේ. | ස්වසනයේ දී කාබන් ඩයොක්සයිඩ් වායුව පිටවේ. |

13. පදාර්ථ සහ ශක්ති පිළිබඳව ප්‍රකාශ හතරක් පහත දැක්වේ. ඒවා අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
 1. වාතයට ස්කන්ධයක් නැත. එබැවින් වාතය ශක්තියකි.
 2. ආලෝකය අවකාශයේ ඉඩක් නොගන්නා අතර ස්කන්ධයක්ද නැති නිසා ආලෝකය ශක්තියකි.
 3. ධ්වනිය ශක්තියක් වන අතර එය අවකාශයේ ඉඩක් ගනී.
 4. ගඩොලක් අවකාශයේ ඉඩක් නොගන්නා අතර ස්කන්ධය සහිතය. එබැවින් පදාර්ථයකි.

- **14 සහ 15 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන උපයෝගි කරගන්න.**





14. ඉහත ක්‍රියාකාරකමේ දී ලැබෙන නිරීක්ෂණ අනුපිළිවෙලින් සඳහන් පිළිතුරු තෝරන්න.
 1. අයිස් → ජලවාෂ්ප → ජලය   2. ජලය → අයිස් → ජලවාෂ්ප
 3. ජලවාෂ්ප → ජලය → අයිස්   4. අයිස් → ජලය → ජලවාෂ්ප

15. ඉහත අවස්ථා විපර්යාසය සිදුවන්නේ ඉටිපන්දම් දැල්ලෙන් ලැබෙන,
 1. තාපය නිසා ය.   2. උෂ්ණත්වය නිසා ය.
 3. ආලෝකය නිසා ය.   4. ස්පර්ශය නිසා ය.

16. වැසි දිනවලදී වාහනවල වැසූ වීදුරුවක ඇතුළු පැත්තෙහි ජලය පටලයක් තැන්පත් වන බව නිරීක්ෂණය විය. මෙයට හේතුව වන්නේ,
 1. වාහනය තුළ වාතයේ ජලවාෂ්ප පැවතීමයි.   2. වර්ෂා ජලය වීදුරු හරහා කාන්දුවීමයි.
 3. වාහන වීදුරු මත දූවිලි තැන්පත්වී තිබීමයි.   4. වාහනය තුළින් වාතය පිටතට ගමන් නොකිරීමයි.


17. ශාකවල සහ සතුන්ගේ ස්වසනය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක්ද?
 1. සතුන් ස්වසනය කරන අතර ශාක ස්වසනය නොකරයි.
 2. ස්වසනය යනු ආශ්වාස කිරීම සහ ප්‍රශ්වාස කිරීමයි.
 3. ශාක මෙන්ම සතුන්ද ස්වසනයේ දී චලන දක්වයි.
 4. ශාක මෙන්ම සතුන්ද ස්වසනයෙන් ශක්තිය නිපදවාගනී.

18. සමාන ජල පරිමා විවිධ හැඩයේ භාජන හතරකට දමා ඇති අයුරු පහත දැක්වේ.



මෙම ක්‍රියාකාරකමෙන් වඩාත් හොඳින් පෙන්වා දියහැක්කේ,
 1. ජලයට නිශ්චිත හැඩයක් ඇති බවයි.
 2. ජලය ඕනෑම භාජනයකට දැමිය හැකි බවයි.
 3. ජලය අඩංගු භාජනයේ හැඩය ගන්නා බවයි.
 4. ජලය ද්‍රව අවස්ථාවේ පවත්නා බවයි.

19. වාතයෙහි ලක්ෂණ හඳුනා ගැනීමට සිදු කරන ලද ක්‍රියාකාරකමක රූපයක් මෙහි දැක්වේ.
 මෙයින් ලබා ගතහැකි නිගමනයක් වන්නේ,
 1. පරීක්ෂා නළය තුළ වාතය ඇති බවයි.
 2. පරීක්ෂා නළයට ජලය ඇතුළු නොවන බවයි.
 3. නළය ජලය තුළට තල්ලුකිරීම අපහසු බවයි.
 4. වාතය අවකාශයේ ඉඩක් ගන්නා බවයි.




20. සිසිල් ජල භාජනයකට එක්වරම අයිස් කැටයක් වැටීමට සැලැස්වූ විට ක්ෂණිකවම නිරීක්ෂණය වන්නේ,
 1. එකවරම ජලයේ උෂ්ණත්වය පහළ යාම.   2. අයිස් කැටය ජලය යටට ගොස් මතුපිටට පැමිණ පාවීම.
 3. භාජනයේ ජලය වාෂ්ප වීමට පටන් ගැනීම.   4. භාජනය සහ ජලය වේගයෙන් සිසිල්වීම.

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

# II කොටස

උපදෙස් :
- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. (ලකුණු 16 යි).**
- **ඉතිරි ප්‍රශ්න 6 න් ඔබ කැමති ප්‍රශ්න 4 කට පමණක් පිළිතුරු ලියන්න.**
- **පිළිතුරු ලිවීම සඳහා වෙනම කඩදාසියක් භාවිතා කරන්න. (ලකුණු 11 x 4 = 44 යි).**

01) (අ) ක්ෂේත්‍ර චාරිකාවක් සඳහා 6 ශ්‍රේණියේ දරුවන් රැගෙන ගිය උපකරණ ලැයිස්තුවක් පහත දැක්වේ.

අත්කාචයක්, පෙට්‍රිදීසියක්, මුල්ලුවක්, ඩැහි අඬුවක්, කතුරක්, කුඩා බෝතලයක්, දෙනෙතියක්, පොතක්, පැන්සලක්

ඉහත උපකරණ යොදගත හැකි අවස්ථා අනුව පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| | අවස්ථාව | උපකරණය |
|---|---|---|
| 1. | පළගැටියකු අල්ලා බෝතලයට දැමීමට | ................................. |
| 2. | කුරුමිණියකුගේ පාද සංඛ්‍යාව සෙවීමට | ................................. |
| 3. | ශාකයකින් පත්‍රයක් වෙන් කර ගැනීමට | ................................. |
| 4. | පියාඹන කුරුල්ලකු නිරීක්ෂණයට | ................................. |
| 5. | පස තුළ සිටින ජීවීන් රැස්කිරීමට | ................................. |

(ල. 05)

ආ. i. ඉහත අධ්‍යයනයේදී පරිසරයේ හමුවන දේ, ජීවී/ අජීවී ලෙස වර්ගීකරණය කරන ලදී. මේ සඳහා යොදා ගතහැකි ජීවීන් සතු ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

ii. මෙහිදී ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණය කිරීමට නොහැකිවූ බව ගුරුතුමා පවසයි. ඊට හේතුව කුමක්ද? (ල. 01)

iii. ශාක පත්‍රයක් මත එහි වර්ණයට සමාන පළගැටියෙකු සිටී. පළගැටියා සතෙකු ලෙස නම් කිරීමට හේතුවන්නට ඇති ලක්ෂණය කුමක් ද? (ල. 01)

iv. සතුන් විෂම පෝෂීන් ලෙස ගුරුතුමා හඳුන්වා දෙන ලදී. විෂම පෝෂීන් යනු කවුරුන් ද? (ල. 01)

ඉ. i. ඉහත චාරිකාවේදී නිරීක්ෂණය කරගන්නා ලද ජීවීන් කීපදෙනෙකු පහත දැක්වේ.


ගැඩවිලා, සමනලයා, වේයා, කුරුමිණියා, කුඩා මත්ස්‍යයා

ජීවීන්ගේ සංචරණ ක්‍රම අනුව පහත වගුව පුරවන්න.

| සත්ත්වයා | සංචරණ ක්‍රමය |
|---|---|
| සමනලයා | |
| වේයා | |
| කුඩා මත්ස්‍යයා | |

(ල. 03)

ii. ඉහත සතුන් වර්ගීකරණය සඳහා සකසා ඇති පහත දෙබෙදුම් සූචිය පිළිතුරු පත්‍රයෙහි පිටපත් කරගෙන හිස්තැන් පුරවන්න.




(ල. 03)



agaram.lk

www.agaram.lk

02) පරිසර නිරීක්ෂණ දින පොතක දක්නට ලැබුණු වාර්තා කීපයක් පහත දැක්වේ.

ජනවාරි 01 - අද කාර්ය බහුල දිනයකි. වහලය අලුත්වැඩියා කිරීමට යොදගත් විදුලි උපකරණවල ඝෝෂාව නිසා කිසිවක් කරගත නොහැකි විය.

ජනවාරි 02 - ශීතකරණයෙන් පිටතට ගත් අයිස් කැටයක් බිම වැටී දියවනු දක්නට ලැබුණි.

ජනවාරි 03 - වාතය පුරවන ලද බැලුන කීපයක් දහවල් වන විට හඬනගමින් පුපුරා ගියේය.

ජනවාරි 04 - රෝස මලකින් සමනලයකු පැණි උරා බොන අයුරුත්, ගැරඬියකු විසින් මීයකු ගිල දමන අයුරුත් දක්නට ලැබුණි.

i. a. ජනවාරි 01 දින තොරතුරුවලට අදළ ශක්ති ආකාර 2 ක් ලියන්න. (ල. 02)

b. ඉහත ඒවා ශක්තීන් ලෙස නම් කිරීමට හේතු 2 ක් ලියන්න. (ල. 02)


ii. ජනවාරි 02 දින සිදුවීමට අදළ පදර්ථයේ අවස්ථා දෙක ලියන්න. (ල. 02)

iii. a. ජනවාරි 03 දින සිද්ධිය සම්බන්ධ බැලුන් පිපිරීමට හේතුවූ ශක්තිය කුමක්ද? (ල. 01)

b. එම ශක්තිය නිපදවා ගැනීමට හැකි වෙනත් උපකරණ 2 ක් ලියන්න. (ල. 02)

iv. ජනවාරි 04 වැනි දින නිරීක්ෂණවලට අනුව සමනලයාගේ සහ ගැරඬියාගේ භෝජන ක්‍රම අනුපිළිවෙලින් ලියන්න. (ල. 02)

03) i. a. පදර්ථයේ ලක්ෂණ ආදර්ශනයට පන්තියේ සකසන ලද ඇටවුමක රූපයක් පහත දැක්වේ.





අ. ඉහත ඉරටුව සමතුලිතව පැවතීමට හේතුව කුමක්ද? (ල. 01)

ආ. B බැලුනය සිදුරු කළහොත් ලැබෙන නිරීක්ෂණ 2 ක් ලියන්න. (ල. 02)

ඉ. සිදුරු කිරීමෙන් ස්වල්ප වේලාවකට පසු ඉරටුව පිහිටන ආකාරය ඇඳ දක්වන්න. (ල. 02)

ඊ. මෙම ක්‍රියාකාරකම මගින් ශිෂ්‍යයා පෙන්වා දීමට අපේක්ෂා කළ පදර්ථය සතු ගුණය කුමක් ද?(ල.1

ii. ශාකවල සිදුවන ප්‍රභාසංශ්ලේෂණ ක්‍රියාවලියට අදල රූපසටහනක් පහත දැක්වේ.




අ. ඉහත ක්‍රියාවලියේ දී ශාක උරාගන්නා සහ පිට කරන A හා B වායුවල නම්, පිළිවෙලින් ලියන්න. (ල. 02)

ආ. මෙම ක්‍රියාවලියට ශාක මුල් මගින් අවශෝෂණය කරගන්නා C සංඝටකයේ නම ලියන්න. (ල. 01)

ඉ. ඉහත කාර්යයට අවශ්‍ය ශක්ති ආකාරය කුමක් ද? (ල. 01)

ඊ. මෙම ක්‍රියාවලියෙන් මිනිසාට ලැබෙන එක් වාසියක් ලියන්න. (ල. 01)

04) ඝන පදර්ථයේ ගුණ සොයාබැලීමට දරුවන් පිරිසක් සංවිධානය කරන ලද ක්‍රියාකාරකමකට යොදගත් ද්‍රව්‍ය කීපයක් පහත දැක්වේ.

| |
|---|
| යකඩ ඇණයක්, ටින් තහඩුවක්, තිරිඟු පිටි ස්වල්පයක්, රටහුණු කැබැල්ලක්, වැලි ස්වල්පයක්, අඟුරු කැබැල්ලක්, රබර් පටියක්, යකඩ කම්බි කැබැල්ලක්, තඹ කම්බි කැබැල්ලක්, පවුඩර් ස්වල්පයක් |

i. ඉහත ද්‍රව්‍ය අතරින් අතින් ස්පර්ශ කල විට සිනිඳු බවක් දැනෙන ද්‍රව්‍යයක් නම් කරන්න. (ල. 01)

ii. මිටියකින් තැලූවිට කුඩුවන ද්‍රව්‍යයක් ලියා එහි භෞතික ගුණය ඉදිරියෙන් ලියන්න. (ල. 02)

iii. a. මේවා අතර ඇති තන්‍ය ද්‍රව්‍යයක් ලියන්න. (ල. 01)

b. එම ද්‍රව්‍යය එදිනෙද ජීවිතයේ භාවිතයට ගන්නා අවස්ථාවකට උදහරණයක් ලියන්න. (ල. 01)

iv. a. ළදරු සූප්පු හා අත් ආවරණ සැදීමට සුදුසු ද්‍රව්‍යයක තිබිය යුතු ගුණය කුමක් ද? (ල. 01)

b. ඉහත භෞතික ගුණය සහිත ද්‍රව්‍ය, ඉහත ලැයිස්තුවෙන් තෝරා ලියන්න. (ල. 01)

v. a. රබර් පටි, කම්බි කැබලි, ලෝහ තහඩු ආදියෙන් බලයක් යෙදූවිට ඇදෙන සුලු ද්‍රව්‍යය තෝරා ලියන්න. (ල. 01)

b. එම ද්‍රව්‍යය භාවිතයට ගන්නා අවස්ථාවක් ලියන්න. (ල. 01)


vi. a. වැලි කඩදාසි භාවිතයට ගන්නා අවස්ථාවක් ලියන්න. (ල. 01)



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

b. වැලි කඩදාසි භාවිත කරන්නේ කුමන ගුණයක් සහිත නිසාද? (ල. 01)

05) ජලයේ ලවණතාවය එම ජලය ලබා ගන්නා ස්ථානය අනුව වෙනස් වේ. වැවකින්, මුහුදෙන් සහ කලපුවකින් ලබාගත් සමාන ජල පරිමා තුනක් සමාන පෙට්‍රි දීසි තුනක දමා තද අව්වේ තබන ලදී.



A වැව් ජලය B මුහුදු ජලය C කලපු ජලය

i. a. ජලය සියල්ල වාෂ්ප වූ පසු පෙට්‍රි දීසි තුළ වැඩියෙන්ම ද්‍රව්‍ය ඉතිරි වන්නේ කුමන පෙට්‍රි දීසියේ ද? (ල. 01)

b. මෙම ඉතිරිවන ද්‍රව්‍යයේ වැඩිපුරම අඩංගු වී පැවතිය ඇතැයි සිතිය හැකි රසායනික සංයෝගය කුමක් ද? (ල. 01)

ii. ඉහත පෙට්‍රි දීසි ඉතා තද අව්වේ තැබීමට හේතුව කුමක් ද? (ල. 01)

iii. තද අව්වේ තැබීම වෙනුවට කළ හැකි වෙනත් උපක්‍රමයක් යෝජනා කරන්න. (ල. 01)

iv. ඉහත ජල සාම්පලවල වැඩිම ස්කන්ධයක් සහ අඩුම ස්කන්ධයක් ඇති පෙට්‍රි දීසි අනුපිළිවලින් ලියන්න. (ල. 02)

v. කරදිය සහ කිවුල් දිය සහිත පෙට්‍රි දීසි A, B, C අක්ෂර ඇසුරින් අනු පිළිවෙලින් දක්වන්න. (ල. 02)

vi. ඔබේ නිගමන ඇසුරින් ලවණතාවය යන්න පැහැදිලි කරන්න. (ල. 02)

vii. ආහාර පිළියෙල කිරීමේදී රසකාරකයක් ලෙස භාවිත කිරීමට වඩාත් සුදුසු කිනම් පෙට්‍රි දීසියේ ජලය ද? (ල. 01)

06) i. පෘථිවිය මත ජලය, ඝන, ද්‍රව, වායු අවස්ථා තුනෙන්ම පවතී.

a. පෘථිවිය මත ඝන අවස්ථාවේ ජලය පවතින ආකාර දෙකක් ලියන්න. (ල. 02)

ඉ. ස්වාභාවික පරිසරයට ජලය ලැබෙන එක් ආකාරයකි වර්ෂණය. වර්ෂණයේ ආකාර දෙකක් ලියන්න.(ල. 02)

ii. ජීවීන්ගේ පාරිභෝජනයට නුසුදුසු මට්ටමට ජලයට අපද්‍රව්‍ය එකතු වීම ජල දූෂණය නම් වේ.

a. ජල දූෂණයට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ල. 02)

b. දූෂණය වූ ජලය සහ දූෂණය නොවූ ජලය අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ල. 02)

c. දූෂිත ජලය පාරිභෝජනය කිරීම නිසා වැළඳිය හැකි රෝගයක් ලියන්න. (ල. 01)

d. නිවසේ දී ජලය භාවිතය සම්බන්ධ යහ පුරුදු දෙකක් සඳහන් කරන්න. (ල. 02)

07) ජලය අපතේ යන අවස්ථා අවම කරගැනීමට යොමු කරන පණිවිඩයක් සහිත පෝස්ටරයක් නිර්මානය කිරීමට ඔබට පැවරී ඇතැයි සිතන්න.

i. පාසලේ දී ඔබට නිරීක්ෂණය වූ ජලය අපතේ යන ස්ථාන දෙකක් සඳහන් කරන්න. (ල. 02)

ii. ඉහත ස්ථාන දෙකෙහි ජලය අපතේ යාමට හේතුවක් ලියන්න. (ල. 01)

iii. ඉහත අපතේ යාම වළක්වා ගැනීමට යෙදිය හැකි උපක්‍රම දෙකක් ලියන්න. (ල. 02)

iv. ජලය අපතේ යන ස්ථානවල ඇති ශාකවල, අනෙක් ශාකවලට වඩා දැකිය හැකි වෙනස්කම් දෙකක් ලියන්න. (ල. 02)

v. අපතේ යන ජලය තැන් තැන්වල රැස්වීම නිසා මදුරුවන් බෝවිය හැක. එමගින් පැතිරී යා හැකි රෝගයක් සඳහන් කරන්න. (ල. 01)

vi. මදුරුවන් මගින් බෝවන රෝග පැතිරී යාම වැළැක්වීමට පාසලේ දී අනුගමනය කළ හැකි ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ල. 02)

vii. ඔබ නිර්මාණය කළ පෝස්ටරයට යෙදීමට සුදුසු ප්‍රකාශනයක් ලියන්න. (ල. 01)

* * * * *

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk